සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය ජුනි 04

නර්තනය

10 ශ්‍රේණිය

Prepared by: K.N.I.පුෂ්පකාන්ති මිය
කෑ/දෙහි/වහරක ම.වි

1. නිපුණාතවය 5.0 - ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

2. නිපුණාතාව මට්ටම 5.1- ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.

3. පාඩම - නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විමසමු

4. ඉගෙනුම් ඵල -

- නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු ලබාගත හැකි කාල වකවානු නම් කරයි.
- නර්තන කලාව විවිධ ස්වරූපයෙන් පැවති බවට දැක්වෙන මූලාශ්‍ර නම් කරයි.
- ලංකාවට පැමිණි විදේශිකයන් නර්තන කලාව පිළිබඳ ලියා ඇති තොරතුරු ඉදිරිපත් කරයි.
- රජවරු නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් ආකාරය විස්තර කරයි.
- ආගමික අවස්ථා සඳහා යොදාගත් ආකාරය පැහැදිලි කරයි.

5. ශිෂ්‍යා කළයුතු කාර්‍යයන්

- පුතේ ඔයාලා 9 ශ්‍රේණියේ දී ඉගෙනගත් අනුරාධපුරය, පොලොන්නරුව, ගම්පොළ, කෝට්ටේ යුගවල සෙල්ලිපි, ලෙන්ලිපි, සංදේශ කාව්‍ය පිළිබඳ සොයාගත් තොරතුරු සිහිපත් කරන්න. ඒ තොරතුරු ලබාගත් ආකාරයටම වංශකථා, දේශාඨන වාර්තා ඇසුරින් තොරතුරු ලබාගත හැකි බව ඔබටම වැටහේවි. එය අනුගමනය කරමින් තොරතුරු සපයා ගන්න.
- නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ ලියවුණු පොත්පත් පරිශීලනය කරන්න.
- විවිධ කාල වකවානුවල පාඩමට අදාල තොරතුරු රැස් කරන්න.
- පොත් පිංචක් සකසන්න.

6. කාර්‍ය පත්‍රකාව :

1. විවිධ කාල වකවානු යුග වශයෙන් නම් කරන්න.
2. නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර නම් කරන්න.
3. එක් මූලාශ්‍රයක් ඇසුරින් සාධකයක් ඉදිරිපත් කරන්න.
4. නර්තන කලාව පිළිබඳ විදේශිකයින්ගේ වාර්තාවක් ඇසුරින් දක්වන්න
5. රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවති විශේෂ උත්සවයක් නම් කර පැවැත්වූ ආකාරය විස්තර කරන්න.

6. පහත වගුව සම්පූර්ණ කරන්න.

| වංශකතා හා දේශාටන වාර්තා | දායක වූ රජවරු | නර්තනය භාවිතා කළ ආකාරය |
|---|---|---|
| මහා වංශය | 1 පණ්ඩුකාභය රජතුමා | 1.<br>2. |
| | 2. | 1.<br>2. |
| | 3. | 1.<br>2. |
| | 4. | 1.<br>2. |
| | 5 මහා පරාක්‍රමභාහු රජතුමා | 1.<br>2. |
| චූල වංශය | පරාක්‍රමබාහු රජතුමා | 1.<br>2. |
| විදේශිනයින් දුටු පුරාණ ලංකාව | | 1.<br>2. |
| වාර්තාව | ස්පිල් බර්ජන් | 1.<br>2. |
| | රොබට් නොක්ස් | 1.<br>2. |

7. අතිරේක කියවීම් සඳහා

- ❖ සිංහල නර්තන කලාව - මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
- ❖ 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන ආයතනය
- ❖ 10 ශ්‍රේණිය නර්තනය - ඥානසිරි පීරිස් මහතා

ඉහත ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි *Web site, LMS*, පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e- තක්සලාව - - https://www.e-thaksalawe.mo.go.lk
- e- නැණ පියස - Course : 10 වසර නර්තන කලාව
- වෙනත් - https://youtu.be/OaGjUpmVu4Y
  https://youtu.be/tVmlcFn0GyA
  https://youtu.be/8HlcuPnplZU

**කියවීම් පත්‍රිකාව -**

නර්තන කලාව විවිධ ස්වරූපයෙන් පැවති බව යුග වශයෙන් වෙන්කර දැක්විය හැකිය. ප්‍රාග් බෞද්ධ යුගය, අනුරාධපුර යුගය, පොලොන්නරු යුගය, දඹදෙණි යුගය, කුරුණෑගල යුගය, ගම්පල යුගය, කෝට්ටේ යුගය, මහනුවර යුගය, කොළඹ යුගය ආදී වශයෙන්. පුරාවිද්‍යාත්මක වශයෙන් හා ලිඛිත වශයෙන් මූලාශ්‍ර මගින් තොරතුරු හමුවේ. වංශකතා, ශිලා ලේඛන, විදේශිකයින්ගේ වාර්තා, සාහිත්‍ය කෘති, සඳහන් කළහැකිය. පණ්ඩුකාභය, දුටුගැමුණු, මහදැලියා මානා, භාතිකාභය, මහා පරාක්‍රමබාහු රජු වැනි රජවරු නර්ත කලාවට රාජ්‍ය අනුග්‍රහය ලබා දී ඇති බව තොරතුරු වලින් පැහැදිලි වේ. ඉබන් බතූතා, ස්පිල් බර්ජන්, රොබට් නොක්ස්, පාහියන් වැනි විදේශිකයින්ගේ නර්තන කලාව පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත. ආගම් අවස්ථා සඳහාද නර්තන කලාව යොදාගත් බව "ස්නාන පූජා" තුළින් පැහැදිලි වේ. එකල පැවති තොරතුරු අනුව පැහැදිලි වන්නේ භරත නැටුම්, කල ගෙඩි නැටුම්, විවිධ කාල වල දක්නට ලැබුණු බවයි.

- සිරස වස්තුපුර පැවති මංගල උත්සවයක් නැටුම් ගැයුම් සහිතව පැවැත්වූ බව.
- පණ්ඩුකාභය රජු නැටුම් ගැයුම් වැයුම් අවස්ථාවලදී චිත්තරාජ කාලවේල යක්ෂයින් සමග සම අසුන් පනවා දෙව් මිනිස් නැටුම් නැරඹූ බව.
- දුටුගැමුණු රජු නළගනන් 16000 පිරිවරා රුවන්වැලිසෑය බිඳිනස ස්ථානයට ගිය බව.
- මහා දඨික මහා නාග රජු ගිරිභණ්ඩ පූජාව කලබව, එහිදී සතර දොරටු සරසා තැන තැන තොරන් බැඳ ධජ බඳවා පහන් දල්වා නැටුම් ගැයුම් වැයුම් පැවැත්වූ බව.
- භාතිකාභය රජු බෝධි ස්නාන පූජාව පැවැතවූ බව.
- මහා පරාක්‍රමබාහු රජතුමා සරස්වතී මණ්ඩපය ඉදිකල බව.
- මහා පරාක්‍රමබාහු රජතුමා නගර නිර්මාණයේදී නාටකශාලා පහක් ඉදිකල බව ද ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා විශේෂ මණ්ඩපයක් ඉදිකල බව.
- ලන්දේසි ජාතික ස්පිල් බර්ජන් "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්, ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකය වැඩදැමූ වස්ත්‍ර ඇත්තේය". යන්න සඳහන් කරයි.
- රොබට් නොක්ස් ඇසල පෙරහැර ගැන සඳහන් කර ඇත්තේ එහි දේවාල විහාර වල තේවාව සඳහා නියමවූ කුල වලින් පැමිණ කල ගෙඩි සෙල්ලමේ යෙදෙන නලඟනන් වෙත්, ඔවුන් හට නියමු වූ විවිධ ක්‍රීඩා කරමින් තුන්දෙනා බැගින් අතිනත ගෙන රඟන ස්ත්‍රී වූ වෙති.
- ඉබන් බතූතා දෙවුන්දර උපුල්වන් දේවාලයේ මිනිස් උස ප්‍රමාණයේ දෙව් රුවක් අබියස හින්දු බාලිකාවන් 500 ක් ගී ගයා නැටූ බව සඳහන් කරයි.


**සැකසුම : K.N.I.පුෂ්පකාන්ති මිය**

**අධ්‍යාපන ආයතනය කෑ/දෙහි/වහරක ම.වි**

**දෙහිඕවිට කලාපය**